**ශීර්ෂය 153 - ඉඩම් අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂ 153 - ඉඩම් අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 29 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම.**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1. විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදන හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 3,391.79 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 2,890.26 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 501.53 ක් හෙවත් සියයට 14.79 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 282.52 | 270.31 | 12.21 | 4.32 |
| මූලධන | 3,109.27 | 2,619.95 | 489.32 | 15.74 |
| **එකතුව** | **3,391.79** | **2,890.26** | **501.53** | **14.79** |

2.2. **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 14.40 | 13.88 | 6.50 | 8.26 | 50.00 | 31.54 |

**2.3. අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/000/0383/0015/00 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.136,370 ක් විය.

**2.4. විගණන නිරීක්ෂණය**

ඉඩම් අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

3. **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් තුනක් සඳහා සලසා තිබුණු රු.මිලියන 25.61 ක ශුද්ධ ප්‍රතිපාදනය මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 21 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබිම නිසා ප්‍රතිපාදනවලින් උපයෝජනයන් කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 83 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසදුම් ප්‍රකාශය**

විෂය අංක 15301 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසදුම් ප්රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසදුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 282,526 ක් වූ අතර, එම හිගහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 11 දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව ගිණුම් සංසන්දනය සිදු කළ යුතු වුවත්, එම සැසදීම සිදු කිරිම සඳහා පාලන ගිණුමක් පිළියෙල කර නොතිබුණි

**3.4. වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

අමාත්‍යාංශය සතු වාහන 2 ක් වසර 2 ක කාලයක සිට භාවිතා කිරීමෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයේදී ඇති වූ වෙනස්කම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් විසින් කරුණු පැහැදිලි කරගෙන ඉදිරි පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු වත්කම්**

අමාත්‍යාංශය සතු වාහන 13 කින් 11 ක් වර්ෂ 10 ක කාලයක සිටද, තවත් වාහන 02 ක් වර්ෂයකට අධික කාලයක සිටද, විධිමත් ලෙස පැවරීමකින් තොරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි.

**(ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

මුදල් අමාත්‍යාංශය සතුව තිබුණු වාහන 2 ක්ද, කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව තිබුණු වාහන 2 ක්ද අමාත්‍යාංශය විසින් විධිමත් ලෙස පවරා ගැනීමකින් තොරව වර්ෂ 10 කට අධික කාලයක් මුළුල්ලේ භාවිතා කර තිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන රු.31,271,585 ක් වූ බැරකම් පැවැතුණි. සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.581,599 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ පෙන්නුම් කර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා පදනම් ආයතනය හා ඉන්දියාවේ මහර්ෂි අරවින්ද් පදනම ඒකාබද්ධව සංවිධානය කර තිබූ දින 10 ක විදේශීය වැඩමුළුවක් සඳහා ඉඩම් අමාත්‍යාංශයේ නිලධාරීන් සිව් දෙනෙක් විදේශගත වී තිබුණි. ඒ සඳහා නවාතැන් සහ ආහාර පානාදිය පුහුණු ආයතනයෙන් ලබා දී තිබුණද, 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 6 ඡේදයට පටහැනිව සංයුක්ත දීමනා ලෙස රු.1,174,960 ක් ගෙවා තිබුණි.

## 3.6 කාර්යසාධනය

ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ඉටු කර නොතිබුණු කාර්යයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉඩම් තොරතුරු ක්ෂේත්‍රගත කිරීම සඳහා වන වැඩසටහන සඳහා රු.25,000,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණු නමුත් එම වැඩසටහන සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සංවර්ධන අංශයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව කර්මාන්ත සංවර්ධනය සඳහා ඉඩම් වෙන්කිරීම සහ අමාත්‍යාංශ හා රජයේ දෙපාර්තමේන්තු සඳහා ඉඩම් නිදහස් කිරීම යන කාර්යයන් සිදු කර නොතිබුණි.

(ආ) **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

**--------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ඉඩම් විවිධ කාර්යයන් සඳහා යෙදවීමේ ප්‍රගතිය පහත පරිදි විය.

| ඉඩම් යෙදවූ කාර්යය | ප්‍රගතියේ ප්‍රතිශතය |
|---|---|
| රජයේ ඉඩම් ආර්ථික කටයුතුවල යෙදවීම | 45 |
| දීර්ඝකාලින බදුකර ලබාදීම | 56 |
| දීමනා පත්‍ර ලබාදීම | 48 |
| පූජාභූමි දීමනා පත්‍ර ලබාදීම | 60 |
| නිරවුල් කිරීමේ නියමය සඳහා අනුමැතිය ලබාදීම | 27 |
| බිම්සවිය වැඩසටහන යටතේ දීර්ඝකාලින බදු නි නිර්දේශ කිරම | 22 |

(ii) බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත පරිදි විය.

| වර්ෂය | ප්‍රතිපාදනය | වියදම | ඉලක්කගත හිමිකම් සහතික ප්‍රමාණය | මැනුම් කරන ලද බිම් කැබලි සංඛ්‍යාව | නිර්දේශ කර අනුමත කරන ලද සංඛ්‍යාව | තීරණය ප්‍රසිද්ධ කළ/ ගැසට් කළ සංඛ්‍යාව | පුද්ගලයින් විසින් ලබාගෙන ඇති හිමිකම් සහතික ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | | | | | |
| 2013 | 800 | 668 | 135,000 | 110,630 | 71,315 | 58,690 | 28,402 |
| 2014 | 400 | 445 | 122,090 | 122,239 | 53,448 | 66,759 | 24,242 |
| 2015 | 546 | 413 | 206,580 | 83,957 | 51,475 | 53,484 | 29,043 |

බිම්සවිය වැඩසටහනෙහි 2015 වර්ෂයේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත හිමිකම් සහතික සංඛ්‍යාව 206,580 ක් වූ අතර ඉන් නිර්දේශ කර අනුමත කරන ලද කැබලි සංඛ්‍යාව 51,475 ක් විය. 2015 වර්ෂයේ තීරණ ප්‍රසිද්ධ කිරීමෙන් ගැසට් කරන ලද කැබලි සංඛ්‍යාව 53,484 ක් විය. වාර්ෂික ඉලක්කගත හිමිකම් සහතික පත්‍ර සංඛ්‍යාව කැබලි 206,580 කින් ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කරන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 43,132 ක් වූ අතර එයින් පුද්ගලයන් වෙත නිකුත් කරන ලද හිමිකම් සහතික ප්‍රමාණය 29,043 ක් විය. එය වාර්ෂික ඉලක්කයෙන් පිළිවෙලින් සියයට 21 හා සියයට 14 ක් පමණක් විය.

**(ඇ) ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රගතිය**

**------------------------------------**

ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයේ 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කළ ඉඩම් අත්පත් ලිපිගොනු ගණන 11,428 ක් වූ අතර, ඉන් වන්දි ගෙවා වැඩ අවසන් කර ඇති ගොනු ගණන 102 ක් පමණක් විය. තවද, අතහැර දැමූ අක්‍රීය ලිපිගොනු ගණන 305 ක් වී තිබුණි.

(ii) 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ඉඩම් ආඥා පනතේ 38(අ) අතුරු විධාන ආඥාව නිකුත් කර අවසන් කළ ගොනු ගණන 915 ක් හා 2015 වර්ෂයේදී පමණක් ආඥා පනතේ 38(අ) ආඥාව නිකුත් කිරීමට තිබෙන ගොනු ගණන 3385 ක් වී තිබුණි. වන්දි ගෙවා වැඩ අවසන් කළ ගොනු ගණන 102 ක් වුයෙන් ආඥා පනතේ 38(අ) අතුරු විධාන ආඥාව යටතේ ඉඩම් අත්පත් කර ගැනීම හේතුවෙන් එම ඉඩම් සඳහා රජයට වන්දි හා ඊට අදාළ පොලියද ගෙවීමට සිදු වී තිබුණි.

(iii) 2015 වර්ෂයේ ඉඩම් අත්පත් කරගැනීම සඳහා වන්දි මුදල් ලෙස රු.1,191,453,286 ක් ද, ලිපිගොනු 99 කට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි වෙනුවෙන් පොලී ලෙස රු. 545,572,760 ක් ගෙවා තිබුණි. ඉන් 2005 වර්ෂයේදී අත්පත් කර ගෙන තිබූ ඉඩම් වෙනුවෙන් පමණක් රු.92,991,165 ක්ද, 2005 වර්ෂයට පෙර වර්ෂවල අත්පත් කරගෙන තිබූ ඉඩම් වෙනුවෙන් රු.225,488,171 ක් වූ පොලී මුදලක්ද ගෙවා තිබුණි. මේ අනුව ඉඩම් ආඥා පනතේ 38(අ) අතුරු විධාන ආඥාව යටතේ ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු කරනු ලබන්නේ ඉඩම් අත්පත් කර ගැනීම කඩිනමින් සිදු කිරීම සඳහා වුවත්, අත්පත් කර ගැනීම් සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් එසේ වන්දි ගෙවීම අවසන් වන දිනය දක්වාම පොලී ගෙවීමට සිදු වී තිබුණි. මේ නිසා ආඥා පනතේ 38(අ) අතුරු විධාන ආඥාව යටතේ අත්පත් කර ගැනීම් වෙනුවෙන් රජය විසින් විශාල වියදමක් කර තිබුණි.

**3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**------------------------------**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වු එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2015 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සංවිධානය කරන ලද චීනයේ පැවැත්වුණු වෘත්තීය සංවර්ධන වැඩමුළුවක් සඳහා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) සහභාගී වී තිබුණි. ඒ සඳහා විදේශ රටක විශ්වවිද්‍යාලයක් විසින් අධ්‍යාපන ගාස්තු, නැවතීමේ පහසුකම් සහ අනෙකුත් සේවා පහසුකම් සපයා තිබූ බැවින් ගුවන් ටිකට්පත්, රක්ෂණාවරණ සහ අනියම් දීමනා අදාළ ආයතනයෙන් ගෙවිය යුතු බව දක්වා තිබුණි. එසේ වුවද සහභාගී වූ නිලධාරිනිය වෙනුවෙන් ආහාර පානාදිය සඳහා සංයුක්ත දීමනාවෙන් සියයට 35 ක් වූ රු.162,999 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ආ) හිටපු ඉඩම් අමාත්‍යවරයාගේ හදිසි නිල සංචාරයක් ලෙස දක්වා එංගලන්තයට යාම සඳහා ගුවන් ටිකට්පත් ගාස්තු ලෙස රු. 977,145 ක් 2015 නොවැම්බර් 20 දිනදී ගුවන් සමාගමක් වෙත ගෙවා තිබුණි. මෙහිදී ටිකට්පතෙහි පිටපත්, නිල සංචාරය පිළිබඳ තොරතුරු හෝ විදේශ සංචාරයට එකතු වූ මගින්ගේ විස්තර පිළිබඳ සනාථ වන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. සංචාරය පිළිබඳ සියලු මූලික කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කළ බවද, අග්‍රාමාත්‍ය කාර්යාලයේ උපදෙස් පරිදි අදාළ සියලු ගෙවීම් කටයුතු සිදු කළ බවද, අමාත්‍යාංශයේ ලේකම් විසින් මා වෙත දන්වා තිබුණි. එසේම ඊට අදාළ අනෙකුත් ගාස්තු ලෙස රු.95,000 ක් ගෙවා තිබුණු අතර මෙම මුදල වීසා ගාස්තු, වීසා

අයදුම් පත් ගාස්තු හා ගුවන් ටිකට්පත් දින වෙනස් කිරීම් ගාස්තු වශයෙන් වැය කළ බවත්, අදාළ ලියවිලි නොමැති බව දන්වා තිබුණත්, ලේකම්වරයාගේ අනුමැතිය මත ගෙවා තිබුණි. එම ගෙවීම් සත්‍ය වශයෙන් සිදු වූ බවට පෞද්ගලිකව තහවුරු කරගත් බැවින් අදාළ ගෙවීම් සඳහා අනුමැතිය ලබා දුන් බවට ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) ඉඩම් අමාත්‍යවරයා අසනීප වී වෛද්‍ය ප්‍රතිකාර ගැනීම සඳහා එංගලන්තයේ සිටි අවස්ථාවේ, වැඩබැලීම සඳහා රාජ්‍ය අමාත්‍යවරයා පත් කර තිබුණි. නමුත් විශේෂ රාජකාරී කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා අමාත්‍යාංශයේ ලේකම් දින 5 ක සංචාරයක් සඳහා එංගලන්තයට යාම වෙනුවෙන් රු.526,721 ක් වැය කර තිබුණි. අමාත්‍යවරයා අසනීප තත්ත්වයෙන් සිටියදී රාජකාරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීමට ලේකම්වරයා විදේශ ගතවීම මතභේදයට තුඩුදෙන කරුණක් වී තිබුණි.

## 3.8 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

### (අ) ඇරැව්වල කණිෂ්ඨ විද්‍යාලය සඳහා ඉඩම් අත්කර ගැනීම

---------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හෝ/ නැගෙනහිර ඇරැව්වල කණිෂ්ඨ විද්‍යාලය සඳහා හෙක්ටයාර 0.4085 ක් වූ ඉඩම අත්පත් කර ගැනීම සඳහා ඉඩම් ආඥා පනතේ 38(අ) අතුරු විධාන ආඥාව අනුව 1992 වර්ෂයේදී භුක්තිය භාරගෙන තිබුණි. නමුත් ඒ සඳහා හිමිකම් ඉදිරිපත් කිරීමට ගැසට් පත්‍රයේ පලකිරීම වර්ෂ 16 ක ප්‍රමාදයකින් පසුව 2009 අප්‍රේල් මාසයේදී සිදු කර තිබුණි.

(ii) හිමිකම් සම්බන්ධයෙන් ඇතිවූ ගැටළු නිරාකරණය කිරීමෙන් පසුව වන්දි ගෙවීම 2013 අප්‍රේල් මාසයේදී සිදු කර තිබුණත්, ඒ සඳහා වර්ෂ 20 ක කාලයක් සඳහා පොලී ගෙවීමට සිදු වී තිබුණි. ඒ අනුව ඉඩම් ප්‍රමාණය සඳහා රු.25,404,000 ක වන්දි මුදලක්ද, රු. 31,359,755 ක පොලී මුදලක්ද ගෙවා තිබුණි.

### (ආ) නේවාසිකාගාරයක් සඳහා නිවසක් අත්පත් කර ගැනීම

--------------------------------------------------------

ඉඩම් ආඥා පනතේ 38 (අ) අතුරු විධාන ආඥාව අනුව කටයුතු කර නේවාසිකාගාරයක් සඳහා නිවසක් 2011 සැප්තැම්බර් 09 දින වන විට අත්පත් කර ගෙන නිරවුල් භුක්තියද භාරගෙන තිබුණි. නිරවුල් භුක්තියද භාරගෙන තිබියදීත් වන්දි ගෙවීම ප්‍රමාද වී තිබුණු අතර ඒ සඳහා වන රු.19,650,000 ක් වූ වන්දි මුදල සහ ඒ වෙනුවෙන් පොලිය ලෙස රු. 4,342,874 ක් ගෙවා තිබුණි.

## (ඇ) වැල්ලවාය පොල සඳහා ඉඩම් අත්කර ගැනීම

වැල්ලවාය නගර සැලැසුම් යෝජනා ක්‍රමය යටතේ වැල්ලවාය පොල සඳහා වැල්ලවාය ගමේ ඉඩමකින් රූඩ් 3 පර්චස් 10.4 ක් අත්කර ගැනීම සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ඉඩම් අත්කර ගැනීම් ආඥා පනතේ 38(අ) අතුරු විධානය යටතේ 1989 මාර්තු 28 දින ගැසට් පත්‍රය මගින් භුක්තිය පවරාගෙන තිබුණු අතර 2007 අප්‍රේල් මාසය වන විටත්, වර්ෂ 18 ක් ගත වී තිබුණත්, කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොතිබුණි. අතුරු විධානය ගැසට් පත්‍රයේ පලවූ දිනයේ සිට හිමිකම් පාන්නාට වන්දි මුදල් ගෙවන තෙක් පොලී මුදලක් ගෙවිය යුතු බවට දක්වා තිබියදීත්, මෙම ඉඩමේ සංවර්ධන කටයුත්තක් කිරීමට වසර 18 ක් ගත වනතුරුත් කටයුතු කර නොතිබුණි. එසේම ඉන් පසුව වර්ෂ 26 ක කාලයක් ගතවීමෙන් පසුව රු.41,729,178 ක නිෂ්ඵල වියදමක් ලෙස පොලී ගෙවා තිබුණි.

(ii) 2007 ඔක්තෝබර් 19 දින පැවැත්වූ වැල්ලවාය නගර සංවර්ධන කටයුතු පිළිබඳ සාකච්ඡා තීරණයකට අනුව මෙම ඉඩම මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාව සැකසීම සඳහා යොදා ගැනීම සඳහා අනුමත කර තිබුණි. ඉඩම් ආඥා පනතේ 38(අ) අතුරු ආඥාවක් අනුව පවරා ගැනීම සිදු කරනුයේ ඉතා අත්‍යාවශ්‍ය කටයුත්තක් සඳහා වුවද, මෙහිදී එම අවශ්‍යතාවය අරමුණින් බැහැර කටයුත්තක් වී තිබුණි.

(iii) 1989 මාර්තු 16 දින ඉඩම් ආඥා පනතේ 5 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පල කර පවරා ගන්නා බවට දැනුම් දී තිබුණද, ආඥා පනතේ 7 වන වගන්තිය ප්‍රකාර අයිතිවාසිකම් ඉදිරිපත් කිරිම සඳහා දැන්වීම ගැසට් පත්‍රයේ පල කිරීමට වර්ෂ 19 ක කාලයක් ගත කර තිබුණි. අනතුරුව වන්දි ගෙවීම සඳහා 2015 අප්‍රේල් 30 දින වන විටත් එදින සිට වසර 7 ක කාලයක් ප්‍රමාද කර තිබුණි.

(iv) අත්කර ගත් ඉඩම් ප්‍රමාණය දැක්වීමේදී ගැසට් පත්‍රවල ඉඩම් ආඥා පනතේ 7 වන වගන්තිය යටතේ අත්පත් කර ගැනීමේ නිවේදනය දක්වාම හෙක්ටයාර් 0.374 ක් ලෙස දක්වා තිබුණු අතර 2011 නොවැම්බර් 09 දිනැති ගැසට් පත්‍රයෙහි ශුද්ධි පත්‍රයක් මගින් ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර 0.257 ක් බව දක්වා තිබුණි. ඒ අනුව ඉතිරි ඉඩම් ප්‍රමාණය මාර්ග සංවර්ධන අධිකාරිය පවරාගෙන ඇති බව අමාත්‍යාංශය වෙතින් ඉඩම් හිමිකරුට දැනුම් දී තිබුණ ද ඒ සම්බන්ධ ලිපිගොනු මාර්ග සංවර්ධන අධිකාරියේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා මොණරාගල දිසාපති කාර්යාලයේ ද නොමැති බව ඉඩම් හිමිකරු විසින් දන්වා තිබුණි. මෙම ගැටළුව නිසා 2014 ජනවාරි 06 දින ආඥා පනතේ 17 වන වගන්තිය යටතේ වන්දි මුදල තීරණය කර තිබුණද, 2015 අප්‍රේල් 30 දින වන විටත් එනම් වර්ෂයක පමණ කාලයක් වන්දි ගෙවීමට ප්‍රමාද කර තිබුණි. ඒ සඳහාද රු.1,599,500 ක පොලී මුදලක් ගෙවා තිබුණි.

(v) ඉඩම් අත්කර ගැනිමේ ආඥා පනතේ 38(අ) අතුරු විධාන ආඥාව යටතේ කඩිනමින් ඉඩම් පවරා ගැනීමේ කාර්යයන් සිදු කිරීමේදී වන්දි ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරිම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු නොකිරිම හේතුවෙන් වන්දි මුදල් ගෙවීමේ කාලය විශාල වශයෙන් පමාවීම හේතුකොට ගෙන වන්දි මුදලට වඩා වැඩි පොලී මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

**3.9.** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 20 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 441 | 408 | 33 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 50 | 47 | 03 |
| | **එකතුව** | **519** | **479** | **40** |